ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
**Uva Provincial Council**
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුබසාධන අමාත්‍යාංශය
சுகாதார, சுதேச வைத்திய, நன்னடத்தை சிறுவர் பராமரிப்பு, மகளிர் விவகார மற்றும் சமூக நலன்புரி அமைச்சு
**Ministry of Health, Indigenous Medicine, Probation And Childcare, Women Affairs and Social Welfare**
301, ආර්.එච්. ගුණවර්ධන මාවත, බදුල්ල. 301, ஆர்.எச். குணவர்தன மாவத்தை, பதுளை. 301, R.H. Gunawardene Mawatha, Badulla.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. 5/AD/2/14/වා.ස්.මා/2024 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.12.01 |

ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
බදුල්ල

<u>ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු නියෝග - 2024 වර්ෂය</u>

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෙද සේවය, පවුල් සෞඛ්‍ය සේවය, ඖෂධවේදී සේවය, ඖෂධ සංයෝජක සේවය, වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ සේවය, මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්මික ශිල්පී සේවය, අක්ෂි තාක්ෂණවේදී සේවය, විකිරණ ශිල්පී සේවය, විද්‍යුත් හෘත්තුරේඛණ ශිල්පී සේවය, පාසල් දන්ත චිකිත්සක සේවය, භෞත චිකිත්සක සේවය, වාග් චිකිත්සක සේවය, පශු එන්නත්කරු සේවය හා වාට්ටු ලිපිකරු සේවය යන සේවාවන්හි 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් 2024.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නියෝග කරනු ලැබේ.

02. මෙම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු ලැබ ඇති සියළු නිලධාරීන්ට නියමිත දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන සේ මුදා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකර, ඔවුන් විධිමත් පරිදි නිදහස් කිරීම ආයතන ප්‍රධානීන් විසින් සිදු කල යුතුය.

03. එමෙන්ම, ස්ථාන මාරු ලැබ ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් මා විසින් ලිඛිතව සංශෝධනය කරනු නොලැබුවහොත් ඔවුන් සේවයෙන් මුදා හැර ඔවුන්ගේ වැටුප් විස්තර, නිවාඩු විස්තර හා ලබා ගත්දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර නිවැරදිව නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානීන් වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වේ.

04. තවද, ස්ථාන මාරු ලබා නව සේවා ස්ථානයේ රාජකාරියට වාර්තා කිරීමේ ලිපියේ වාර්ෂික ස්ථාන මාරු නියෝගයේ නම සඳහන් අනු අංකයද ඇතුළත් කර එහි පිටපතක් රාජකාරියට වාර්තා කර දින 14ක් තුළ මෙම අමාත්‍යාංශයට යොමු කිරීමට නව සේවා ස්ථානයේ ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගත යුතුය.

05. එසේම, <u>වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා ඇත්නම් මේ සමග අමුණා ඇති ස්ථාන මාරු ප්‍රතිපත්තියේ ඇතුළත් ආකෘති අංක 06 ප්‍රකාරව අභියාචනයක් සකස් කර 2023.12.15 දිනට පෙර අදාල ආයතන ප්‍රධානියාගේ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කළ යුතු අතර එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් කිසිසේත්ම සලකා බලනු නොලැබේ.</u>

අ.පි.බ


| | | | |
|---|---|---|---|
| ලේකම් / செயலாளர் / Secretary: 055-4936288 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් / சிரேஷ்ட உதவி செயலாளர் / Senior Assistant Secretary: 055-4936300 | අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning): 055-4936297 | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant: 055-4936293 |
| සහකාර ලේකම් (පාලන) / உதவி செயலாளர் (நிர்வாகம்) / Assist.Secretary (Admin): 055-4936292 | සහකාර ලේකම් (ආයතන) / உதவி செயலாளர் (தாபன) / Assist. Secretary (Est.): 055-4936289 | සහකාර ලේකම් (වෛද්‍ය) / உதவி செயலாளர் (வைத்திய) / Assist. Secretary (Medical): 055-4936291 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer: 055-4936290 |
| පොදු දුරකථන / பொது தொலைபேசி / General Tele.: 055-2222803, 055-4936287 | ෆැක්ස් / தொலைநகல் / Fax: 055-2224325 | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / Email: healthupc@gmail.com | https://healthmin.up.gov.lk |

07. මෙම ස්ථාන මාරු නියෝග ඇතුලත් නාම ලේඛනය healthmin.up.gov.lk යන වෙබ් ලිපිනයෙන් බාගත (Download) කරගත හැකි බව දන්වන අතර, අදාළ ස්ථාන මාරු නියෝග අනුව නියමිත දින නව සේවා ස්ථානයේ සේවයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවත්, නිලධරයන් නියමිත දිනට සේවා ස්ථාන වලින් මුදා නොහරින ආයතන ප්‍රධානීන්ද එම නියෝග නොතකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

දයානන්ද රත්නායක
ලේකම්

දයානන්ද රත්නායක
ලේකම්
සෞඛ්‍ය දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක
වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය
ඌව පළාත් සභාව - බදුල්ල

පිටපත -
01. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බදුල්ල / මොණරාගල - කරු.අ.ක.ස